දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2369302, 011-2369305
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: sec-psc@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
No. 177, Nawala Road, Narahenpita, Colombo 05.

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/02-01-05/05/2014
ඔබේ අංකය / உமது இல. / Your No.: MMI/5/12/1/11/1/108
දිනය / திகதி / Date: 2014.11. 03

10 NOV 2014

Ad (Ad)

ලේකම්
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

**<u>රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ (අධ්‍යක්ෂ විශේෂ මාධ්‍ය ඒකකය) තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව සකස් කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධව ඔබේ සමාංක හා 2014.09.26 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුතු රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (විශේෂ මාධ්‍ය ඒකකය) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ පරිපාටියේ මුල් පිටපත මේ සමඟ එවමි.

03. මේ පිළිබඳ අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවා ගැනීමේ පරිපාටිය වෙබ් අඩවියේ පළ කරන ලෙසත් කාරුණිකව වැඩිදුරටත් දන්වමි.

ඩබ්.බී.පී. සිල්වා
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් :- 01. ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව - (මුල් පිටපත මේ සමග එවමි)
02. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - (මුල් පිටපත මේ සමග එවමි)
03. රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව (මුල් පිටපත මේ සමග එවමි)

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙහි

අධ්‍යක්ෂ (විශේෂ මාධ්‍ය ඒකකය ) තනතුර සඳහා

කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ පරිපාටිය

01. සම්බන්ධ වන ආයතන

| | | | |
|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව :රජයේ ප්‍රවෘත්ති | යොමු අංකය : රප්‍ර/ආ01/11(V වෙළුම) | දිනය: 2013.12.27 |
| 1.2 | අමාත්‍යාංශය : ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති | යොමු අංකය : එම්එම්අයි/05/12/101 | දිනය:2014.02.26 |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | යොමු අංකය : DMS/1134 | දිනය: 2013.12.19<br>2014.05.12 |
| 1.4 | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය | යොමු අංකය : EST-2/RECRU/04/3061 | දිනය: 2014.03.31 |
| 1.5 | ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය : NPC/6/5/093/SR-III | දිනය: 2014.03.18 |
| 1.6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | යොමු අංකය : PSC/EST/02-01-05/05/2014 | දිනය:2014.08.14 |

02. පත් කිරීම් බලධරයා: රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය හා උපදෙස් අනුව රජයේ නිල පුවත් වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම.

04. තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය :

මෙම තනතුර තාවකාලිකය. ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකමක් නොමැති කොන්ත්‍රාත් පදනම මත වූ තනතුරකි.

05. මාසික දීමනාව : රු. 30,000.00

විශ්‍රාමික රජයේ නිලධාරියකු නැවත සේවයේ යොදවනු ලබන්නේ නම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2007 සහ ආනුෂංගික චක්‍රලේඛයන්හි විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය.

06. කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගැනීමට අනුමත තනතුරු හා තනතුරු සංඛ්‍යාව

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :-

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| අධ්‍යක්ෂ (විශේෂ මාධ්‍ය ඒකකය) | 01 | 1. ශ්‍රී ලංකාවේ නිල පුවත් වෙබ් අඩවිය අඛණ්ඩව හා යාවත්කාලීනව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් පරිදි ඉටු කිරීම.<br>2. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ විශේෂ මාධ්‍ය ඒකකය පවත්වාගෙන යාම<br>3. ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය විදේශයන්හි ඉහළ නැංවීම පිණිස විදේශ කටයුතු අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණයෙන් යුක්තව කටයුතු කිරීම<br>4. රජයේ සියළුම නිල නිවේදන නිකුත් කිරීමේදී සිංහල හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් මූලික කෙටුම්පත් සකස් කිරීම<br>5. ගරු ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගේ කැබිනට් පුවත්පත් සාකච්ඡා සඳහා මූලික කෙටුම්පත් සකස් කිරීම<br>6. ඉහත රාජකාරිවලට අමතරව රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවරනු ලබන වෙනත් රාජකාරි ඉටු කිරීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : අධ්‍යක්ෂ (විශේෂ මාධ්‍ය ඒකකය) - 01

07. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

7.1 සුදුසුකම්

7.1.1 අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උපාධියක් ලබා තිබීම.

සටහන:
ජනසන්නිවේදනය/සමාජ විද්‍යාව/ දේශපාලන විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

හෝ

II. මාධ්‍ය ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 10 ක් සක්‍රිය සේවයේ යෙදී සිටීම.

7.1.2 වෘත්තීය සුදුසුකම් :

ප්‍රවෘත්ති හා ජනමාධ්‍ය කලාව සම්බන්ධව රජයේ ලියාපදිංචි ආයතනයක ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

7.1.3 පළපුරුද්ද :

රජයේ ලියාපදිංචි ආයතනයක ප්‍රවෘත්තිකරණය සම්බන්ධ විධායක මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 06 ක පළපුරුද්දක් ලබා තිබීම. (ඉහත 7.1.1 I හි සුදුසුකම් සහිත අයදුම්කරුවන් සඳහා පමණි.)

7.1.4 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් මෙම තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.1.5 වෙනත් සුදුසුකම් :

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය
II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.1 හි හා 7.2 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2. වයස :

අවම සීමාව : අවුරුදු 18

උපරිම සීමාව : අවුරුදු 50

විශ්‍රාමික රජයේ නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව අවුරුදු 67

7.3 බඳවා ගැනීමේ ක්‍රමය: ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

7.3.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 40 | අදාළ නොවේ |
| වෘත්තීය සුදුසුකම් | 25 | |
| අතිරේක පළපුරුද්ද | 30 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

සටහන:

1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවාගනු ලැබේ.
2. ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් අනුමත කර ගැනීමට ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශ ලේකම් විසින් කටයුතු කළ යුතුය.

7.3.1.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.4 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

08. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

09. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ :
අත්සන : ..........
නම : පී.ජී.එන්. කුමාරි
තනතුර : සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
දිනය : 2014/08/29

පී. ජී. එන්. කුමාරි
සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා පරිපාලන සේවය
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
කොළඹ 05.

පරීක්ෂා කළේ :
අත්සන : ..........
නම : එස්.ඒ.එල්. සමරසේකර
තනතුර : සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
දිනය : 2014/08/29

එස්.ඒ.එල්. සමරසේකර
සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා පරිපාලන සේවය
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
කොළඹ 05.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : මහාචාර්ය ආරියරත්න ඇතුගල
තනතුර : රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
නිල මුද්‍රාව :
දිනය : 2014/08/29

---

යොමු අංකය : ඊ/ඒ/ඡ/ගරු/05/12/01/108

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (විශේෂ මාධ්‍ය ඒකකය), තනතුර සඳහා වන බඳවා ගැනීම් පරිපාටිය (කොන්ත්‍රාත් පදනම මත) අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........
නම : චරිත හේරත්
ලේකම්
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

දිනය : 2014.09.26

නිල මුද්‍රාව : ..........
චරිත හේරත්
ලේකම්
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය
අංක 163, කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ, කොළඹ 05

---

යොමු අංකය : PSC/EST/02-01-05/05/2014

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ (විශේෂ මාධ්‍ය ඒකකය) තනතුර සඳහා වන මෙම (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීමේ පරිපාටිය 2014.08.14 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී

අත්සන : ........................

නම : ........................

ලේකම්,

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2014-10-31......

නිල මුද්‍රාව : ........................

ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.